(නවවැනි පාර්ලිමේන්තුව - දෙවැනි සභාවාරය)

**අංක 1(2).]**

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2022 පෙබරවාරි 08 අඟහරුවාදා**

---

**2022 පෙබරවාරි 22 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4/2022

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මධ්‍යම අධිවේගී මාර්ගයේ, පොතුහැර සිට ගලගෙදර දක්වා වූ තුන්වන අදියර ඉදිකිරීමේ කොන්ත්‍රාත්තු පිරිනමා තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එසේ නම්, එම එක් එක්—

(i) කොන්ත්‍රාත්තුවේ වටිනාකම කොපමණද;

(ii) කොන්ත්‍රාත්තුව පිරිනැමීමේදී අනුගමනය කරන ලද ක්‍රමවේදය කවරේද;

(iii) කොන්ත්‍රාත් ආයතනයේ නම කවරේද;

(iv) කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

යන්නත් වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම කොන්ත්‍රාත්තු සඳහා මුදල් ගෙවීමේදී අනුගමනය කරනු ලබන මූල්‍යමය ක්‍රමවේදය;

(ii) එම ගෙවීම් සඳහා ප්‍රතිපාදන සපයා ගනු ලබන ආකාරය;

කවරේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

33/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018 හා 2019 වර්ෂවල ශ්‍රී ලංකාවේ මිදි නිෂ්පාදනය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මිදි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(iii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ ඇති මිදි ප්‍රභේද සංඛ්‍යාව කොපමණද;

(ii) මිදි වගාව සඳහා සුදුසු දේශගුණික තත්ත්වයක් ඇති දිස්ත්‍රික්ක කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 2018 හා 2019 වර්ෂවලදී මිදි ආනයනය කිරීම සඳහා වැය කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ශ්‍රී ලංකාව මිදි අපනයනය කරන්නේද;

(iii) එසේ නම්, 2018 හා 2019 වර්ෂවලදී මිදි අපනයනය කිරීමෙන් උපයන ලද ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

246/2022

ගරු හේෂා විතානගේ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) බලන්ගොඩ සිට ගුරුබැවිල, මැද්දෙකන්ද සහ හෙළවත්ත යන ගම්වලට දිනකට ක්‍රියාත්මක කරනු ලබන මගී බස්රථ ගමන් වාර සංඛ්‍යාව මෑතක සිට අඩු කර තිබෙන බවත්;

(ii) ඒ හේතුවෙන් එම ප්‍රදේශවල ජනතාව දැඩි අපහසුතාවයකට ලක්වන බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) ඉහත ගම්මාන සඳහා දිනකට ක්‍රියාත්මක කරනු ලබන මගී බස්රථ ගමන් වාර සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම බස්රථ ගමන් වාර සංඛ්‍යාව වැඩි කිරීමට අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

567/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ප්‍රාග්ධන සමුපකාර බැංකුව සතු වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහන අතරින් ඉහත බැංකුවේ හා නිලධාරීන්ගේ කටයුතු සඳහා යොදවා ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත බැංකුව සතු වාහන බාහිර පුද්ගලයන් වෙත ලබා දී තිබේ නම්, එම එක් එක් පුද්ගලයාගේ නම හා ලිපිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1020/2022

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, බිංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජීවත්වන ජනතාව උග්‍ර පානීය ජල හිඟයකින් පීඩා විඳින බවත්;

(ii) මේ වනවිට බිංගිරිය - හලාවත ජල යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරනු ලබන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ජල යෝජනා ක්‍රමයේ ජලය ගෙන යනු ලබන නල මාර්ගය දෙපස පිහිටි ගම්මාන සඳහා එම ජල යෝජනා ක්‍රමයෙන් ජලය ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) නොඑසේ නම්, එම ගම්මාන සඳහා ජලය ලබා දීමට වෙනත් ජල යෝජනා ක්‍රමයක් ආරම්භ කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1176/2022

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා සීමාසහිත හිඟුරාන සීනි කර්මාන්ත සමාගමේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණු හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපළ හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියා සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියා වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1190/2022

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදුලිබල අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලය සතු සූර්ය බල හා සුළං බල විදුලි බලාගාර සංඛ්‍යාව සහ ඒවායේ ධාරිතාවය;

(ii) මේ වනවිට ඉදිකරමින් පවතින සූර්ය බල හා සුළං බල විදුලි බලාගාර සංඛ්‍යාව සහ ඒවායේ ධාරිතාවය;

(iii) ඉදිරියේදී ඉදිකිරීමට යෝජිත සූර්ය බල හා සුළං බල විදුලි බලාගාර සංඛ්‍යාව සහ ඒවායේ ධාරිතාවය;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1309/2022

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ගෘහස්ථ ගෑස් පරිභෝගිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) 2020 හා 2021 වර්ෂවල ගෘහස්ථ ගෑස් සිලින්ඩරයක පැවති මිල සිලින්ඩරයේ ධාරිතාවය සහ එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ගෘහස්ථ ගෑස් සිලින්ඩරයක අඩංගු එල්.පී.ගෑස්වල තිබිය යුතු බවට පිළිගත් සංයුතිය කවරේද;

(ii) එම සංයුතිය තීරණය කරනු ලබන ආයතනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ගෘහස්ථ ගෑස් සිලින්ඩරයක අඩංගු එල්.පී.ගෑස්වල ප්‍රමිතිය තීරණය කරනු ලබන ආයතනය කවරේද;

(ii) ඒ අනුව, නිසි ප්‍රමිතියකින් යුක්ත බවට පරීක්ෂා කර බලා තහවුරු කරනු ලබන ආයතනය කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1467/2022

ගරු රෝහණ බංඩාර මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අනුරාධපුර නගර සීමාව තුළ අනවසර ඉදිකිරීම් රැසක් සිදු කරනු ලබන බව එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, එම ඉදිකිරීම් නැවැත්වීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1727/2022

ගරු කිංස් නෙල්සන් මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇති වන රක්ෂිතවල නම් කවරේද;

(ii) එම වන රක්ෂිතවලට අයත්වන මුළු භූමි ප්‍රමාණය කොපමණද;

(iii) එම වන රක්ෂිත තුළ පරිසරයට හානිකර විවිධ අයථා කටයුතු සිදු කරනු ලබන බව පරිසර සංවිධාන විසින් පෙන්වා දී තිබෙන බව දන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2022 පෙබරවාරි 23 බදාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

5/2022

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අධිවේගී මාර්ග ඉදිකිරීමේදී අත්පත් කර ගනු ලබන පෞද්ගලික ඉඩම්වලට වන්දි ගෙවීම සඳහා සහ පරිපාලන වියදම් සඳහා අවශ්‍ය මුදල් මහා භාණ්ඩාගාරය විසින් මහාමාර්ග අමාත්‍යාංශයට ලබා දෙන බව එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, දක්ෂිණ අධිවේගී මාර්ගයේ කොට්ටාව සිට ගොඩගම දක්වා වූ කොටස, ගොඩගම සිට හම්බන්තොට දක්වා වූ කොටස, කොට්ටාව සිට කටුනායක දක්වා වූ කොටස, මධ්‍යම අධිවේගී මාර්ගය සහ රුවන්පුර අධිවේගී මාර්ගය යන එක් එක් මාර්ගය ඉදිකිරීමට අදාළව —

(i) වන්දි ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් වෙන් කරන ලද මුදල;

(ii) මේ වනවිට ගෙවා ඇති වන්දි මුදල;

(iii) ගෙවීමට ඉතිරිව ඇති වන්දි මුදල;

(iv) වන්දි ගෙවීමේදී බාධාවන් පවතී නම්, එම බාධාවන්;

(v) ගෙවීමට ඉතිරිව ඇති වන්දි මුදල ගෙවා අවසන් කරනු ලබන දිනය;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

34/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ උණ ලී ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තකරුවන් මේ වනවිට එම කර්මාන්තයෙන් ඉවත් වෙමින් සිටින බවත්;

(ii) එම කර්මාන්තකරුවන්ට අමුද්‍රව්‍ය සපයා ගැනීමේ සහ නිෂ්පාදන අළෙවි කර ගැනීමේ ගැටලු පවතින බවත්;

(iii) එම කර්මාන්තය මඟින් විශාල විදේශ විනිමය ප්‍රමාණයක් උපයාගත හැකි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ උණ ලී ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කරන්නේද;

(ii) එසේ නම්, වර්ෂ 2015දී එමඟින් උපයාගන්නා ලද විදේශ ආදායම කොපමණද;

(iii) ශ්‍රී ලංකාවේ උණ ලී ආශ්‍රිත නිෂ්පාදන අපනයනය නොකරන්නේ නම්, ඒවා අපනයනය කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එම දින වකවානු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකාවේ උණ ලී ආශ්‍රිත නිෂ්පාදන සඳහා වෙළෙඳපොළ පුළුල් කිරීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

247/2022

ගරු හේෂා විතානගේ මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සෝමාවතිය, අලිමංකඩ ප්‍රදේශයේ අක්කර 100ක පමණ වනාන්තර ප්‍රමාණයක් බඩඉරිඟු වගා සඳහා එළිකරමින් පවතින බව දන්නේද;

(ii) එසේ නම්, එය වැළැක්වීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

568/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ප්‍රාග්ධන සමූපකාර සමිතිය නමින් මූල්‍ය ආයතනයක් ස්ථාපිත කර ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම ආයතනය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමතිය ලබා දෙන ලද දිනය කවරේද;

(iii) මේ වනවිට පවතින එම මූල්‍ය ආයතනයේ ශාඛා සංඛ්‍යාව කොපමණද;

(iv) එම ආයතනයේ කටයුතු අධීක්ෂණය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1021/2022

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සමූපකාර ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) සමූපකාර ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ ආරම්භ කරන ලද වර්ෂය කවරේද;

(ii) එම ව්‍යාපාරය ආරම්භ කිරීමේ අරමුණ කවරේද;

(iii) මේ වනවිට ශ්‍රී ලංකාවේ පවතින විවිධ සේවා සමූපකාර සමිති සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) සමූපකාරය තුළින් ග්‍රාමීය පාරිභෝගික අවශ්‍යතා උපරිම අයුරින් ඉටුකිරීමට හැකි බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) එසේ නම්, එම කාර්යභාරය නිසි අයුරින් ඉටුකිරීම සඳහා වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1177/2022

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපළ හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියා සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියා මාර්ග වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1191/2022

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොවිඩ්-19 වසංගතය මර්දනය කිරීම සඳහා ජපානය විසින් තවමත් පර්යේෂණ මට්ටමක පවතින ''අවිගන්'' නම් එන්නතක් නිපදවා ඇති බව දන්නේද;

(ii) එම එන්නත ශ්‍රී ලංකාවට ගෙන්වා තිබේද;

(iii) එසේ නම්, ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iv) එම එන්නත සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානයේ අනුමතිය ලැබී තිබේද;

(v) කොවිඩ්-19 වසංගතය මර්දනය කිරීම සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් අනුමත කරන ලද එන්නත් පමණක් ශ්‍රී ලංකාවට ගෙන්වීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1310/2022

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට වාර්ෂිකව ආනයනය කරනු ලබන බොර තෙල් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය කරනු ලබන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ වාර්ෂික එල්. පී. ගෑස් අවශ්‍යතාවය කොපමණද;

(ii) එම අවශ්‍යතාවයෙන් ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන ප්‍රමාණය හා ආනයනය කරනු ලබන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ශ්‍රී ලංකාවට එල්. පී. ගෑස් ආනයනය කිරීම සඳහා වැය කරනු ලබන මුදල කොපමණද;

(iv) එම ගෑස් ආනයනය කරන සමාගම් කවරේද;

(v) ශ්‍රී ලංකාවේ වාර්ෂික එල්. පී. ගෑස් අවශ්‍යතාවයෙන් ඉහත සඳහන් එක් එක් සමාගම විසින් වාර්ෂිකව ආනයනය කරනු ලබන ප්‍රතිශතය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1468/2022

ගරු රෝහණ බංඩාර මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අතරමැදියන් විසින් ගබඩා කර ඇති වී තොග සොයා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් 2021 වර්ෂයට අදාළව වැටලීම් ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) ඒ යටතේ සිදු කරන ලද වැටලීම් සංඛ්‍යාව කොපමණද;

(iii) එම වැටලීම්වලින් සොයා ගන්නා ලද වී තොග ප්‍රමාණය කොපමණද;

(iv) එම වැටලීම්වලදී ප්‍රශ්න කිරීම්වලට ලක් කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(v) එම එක් එක් පුද්ගලයාගේ නම හා ලිපිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම පුද්ගලයන්ට එරෙහිව මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග සහ ඉදිරියේදී ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1728/2022

ගරු කිංස් නෙල්සන් මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පිහිටා ඇති, මහවැලි ව්‍යාපාරයට අයත් මහවැලි කලාප සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම එක් එක් මහවැලි කලාපයට අයත්වන ගම්මාන වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) 2019 වර්ෂයේ සිට මේ දක්වා ඉහත සඳහන් මහවැලි කලාප සංවර්ධනය කිරීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2022 පෙබරවාරි 24 බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

6/2022

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මධ්‍යම අධිවේගී මාර්ගයේ කුරුණෑගල සිට දඹුල්ල දක්වා වූ සිව්වන අදියරේ ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා ටෙන්ඩර් කැඳවා තිබේද;

(ii) එසේ නම්, එම කොන්ත්‍රාත්තුව පිරිනැමීමට කටයුතු කර තිබේද;

(iii) ඉහත මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද සමාගම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත මාර්ගය ඉදිකිරීමේ වර්තමාන ප්‍රගතිය කවරේද;

(ii) එම මාර්ගය ඉදිකිරීම සඳහා මුදල් සපයා ගන්නා ලද මූලාශ්‍රය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

35/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති මානව පරිභෝජනයට සුදුසු පලා වර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) එම පලා වර්ගවල ඇති පෝෂණ තත්ත්වය පිළිබඳ විධිමත් පරීක්ෂණයක් සිදු කර තිබේද;

(iii) එසේ නම්, එම ආයතනයේ නම කවරේද;

(iv) එම පලා වර්ග අතර ඇති ඒක දේශික පලා වර්ග සංඛ්‍යාව කොපමණද;

(v) ඒවායේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) දේශීය පලා වර්ගවල පෝෂණ හා ඖෂධීය ගුණය ඉහළ බවත්;

(ii) වන විනාශය හා රසායනික පොහොර භාවිතය හේතුවෙන් එම පලා වර්ග දුර්ලභ වී ඇති බවත්;

(iii) ඒ අතරින් ඇතැම් පලා වර්ග මේ වනවිට වඳ වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) දේශීය පලා වර්ග ප්‍රචලිත කිරීමට ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

248/2022

ගරු හේෂා විතානගේ මහතා,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර නගරයේ කම්කරු කාර්යාලය ස්ථාපනය කර ඇති ස්ථානයේ ලිපිනය කවරේද;

(ii) එම කාර්යාලය එම ස්ථානයේ ස්ථාපිත කරන ලද දිනය කවරේද;

(iii) එම කාර්යාලය අවිස්සාවේල්ලට ගෙන යාමට තීරණයක් ගෙන තිබේද;

(iv) රත්නපුර දිස්ත්‍රික් ජනතාවට විශාල සේවයක් සපයන එම කාර්යාලය එම ස්ථානයේම පවත්වාගෙන යාම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

569/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ග්‍රාමීය ප්‍රාග්ධන බැංකුව ස්ථාපනය කිරීමේ අරමුණු කවරේද;

(ii) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එම බැංකුව නියාමනය කරනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1022/2022

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) දේශීය කර්මාන්තයක් ලෙස බතික් කර්මාන්තය ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මේ වනවිට බතික් කර්මාන්තයේ යෙදෙන ව්‍යවසායකයන් හඳුනාගෙන තිබේද;

(ii) එම ව්‍යවසායකයන් දිරිගැන්වීම සඳහා අමාත්‍යාංශය සතු වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) බතික් නිෂ්පාදනයේදී එම ව්‍යවසායකයින් පැරණි ක්‍රමවේද සහ විලාසිතා භාවිතා කරන බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) නව තාක්ෂණය භාවිතා කරමින් නවීන විලාසිතා අනුව බතික් නිෂ්පාදනය කිරීම සඳහා මහපෙන්වීමේ වැඩපිළිවෙළක් සකස් කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1178/2022

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් හෝ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීම (ඉවත් කිරීම) පනත යටතේ භාණ්ඩාගාර ලේකම්වරයා යටතේ ඇති ආයතනවල යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපළ හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියා සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියා වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1192/2022

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2021 ජනවාරි මාසයේ සිට 2022 ජනවාරි මාසය දක්වා වන කාලය සඳහා අධිකරණ අමාත්‍යාංශයට ගොඩනැගිල්ලක් කුලියට ගැනීම සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර තිබේද;

(ii) එසේ නම්, එම ගොඩනැගිල්ල පිහිටා ඇති ස්ථානයේ ලිපිනය කවරේද;

(iii) එම ගොඩනැගිල්ල කුලියට ගැනීම සඳහා වැය කරනු ලබන මුදල කොපමණද;

(iv) කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ශ්‍රී ලංකාව මූල්‍යමය වශයෙන් අර්බුදයට පත් වී ඇති අවස්ථාවක, මෙසේ ගොඩනැගිලි කුලියට ගැනීම යෝග්‍ය වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1311/2022

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2021 වර්ෂයේ ශ්‍රී ලංකාවේ බැංකු විසින් ලබා දෙන ලද ණය සඳහා අය කරන ලද පොළී අනුපාතය කොපමණද;

(ii) ක්ෂුද්‍ර මූල්‍ය ණය සඳහා අය කරනු ලබන පොළී අනුපාතය කොපමණද;

(iii) ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබා දීම සඳහා රජය විසින් නීත්‍යානුකූල අවසරයක් ලබා දෙන්නේද;

(iv) එසේ නම්, මේ වනවිට එම අවසරය ලබා දී ඇති ආයතන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1469/2022

ගරු රෝහණ බංඩාර මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ඇති සුළු වාරිමාර්ග සංඛ්‍යාව හා මහා වාරිමාර්ග සංඛ්‍යාව;

(ii) එම එක් එක් වාරිමාර්ගයේ නම;

(iii) එම එක් එක් වාරිමාර්ගයෙන් ප්‍රතිලාභ ලබන පවුල් සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ වාරිමාර්ග පද්ධතිය තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1729/2022

ගරු කිංස් නෙල්සන් මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වැලි කැණීම සඳහා භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙතින් බලපත්‍ර ලබාගෙන ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) එම බලපත්‍ර ලබා දීමේදී සලකා බලන ලද නිර්ණායක කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) වැලි කැණීමේදී ගංගා, ඇළ දොළ ඇතුළු පරිසර පද්ධතියට සිදුවන හානිය අවම කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2022 පෙබරවාරි 25 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

7/2022

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නව ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම අනුමතිය ලබා දෙන ලද දිනය කවරේද;

(iii) එම නව ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තිය සකස් කිරීමේ වර්තමාන ප්‍රගතිය කවරේද;

(iv) එය සකස් කර අවසන් කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

36/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— වනජීවී හා වනසංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට ආවේණික ඒකදේශික උභයජීවී විශේෂ සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් වඳවියාමේ තර්ජනයට ලක්වීමෙන් රතු දත්ත පොතට ඇතුළත් කර ඇති උභයජීවී විශේෂ කවරේද;

(iii) මේ වනවිට වඳවී ගොස් ඇති ඒකදේශික උභයජීවී විශේෂ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඒකදේශික උභයජීවීන් පිළිබඳ මෑතකදී සමීක්ෂණයක් සිදුකර තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) නොඑසේ නම්, එවැනි සමීක්ෂණයක් සිදු කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඒකදේශික උභයජීවීන් ආරක්ෂා කිරීමට ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

249/2022

ගරු හේෂා විතානගේ මහතා,— වැවිලි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ වාර්ෂික පොල් නිෂ්පාදනය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත කාල සීමාව තුළදී දේශීය වෙළඳපොළේ පොල් මිල කොපමණ ප්‍රමාණ වලින් වෙනස් වූයේද;

(iii) මේ වනවිට දේශීය වෙළඳපොළේ පොල් මිලෙහි වැඩි වීම සඳහා බලපාන ලද සාධක කවරේද;

(iv) ශ්‍රී ලංකාවේ පොල් නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

570/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් ආයතනය විසින් ඛනිජ වැලි මෙට්‍රික් ටොන් 85,000ක් අලෙවි කරන ලද දිනය කවරේද;

(ii) එම ඛනිජ වැලි මිලදී ගැනීම සඳහා අයදුම් කරන ලද එක් එක් සමාගමේ නම, ලිපිනය හා ඉදිරිපත් කරන ලද මිල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ඛනිජ වැලි ලබා ගන්නා ලද එක් එක් සමාගමේ නම, ලිපිනය හා මිල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම ගනුදෙනුවේදී මූල්‍යමය අලාභයක් සිදුවී ඇති බවට ඉදිරිපත් වී ඇති චෝදනා සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1023/2022

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වල ශිෂ්‍යභට පුහුණුවීම් සිදු කරනු ලබන බව දන්නේද;

(ii) එසේ නම්, ශිෂ්‍යභටයන් පුහුණු කිරීමේ ක්‍රියාකාරකම් සිදු කරනු ලබන පාසල් සංඛ්‍යාව කොපමණද;

(iii) එම පාසල් සංඛ්‍යාව ප්‍රමාණවත් වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශිෂ්‍යභට පුහුණුව ලබා දීමට අපේක්ෂා කරනු ලබන පාසල් තිබෙන බව පිළිගන්නේද;

(ii) එම පාසල්වල ශිෂ්‍යභටයන් පුහුණු කිරීම සඳහා පවතින බාධාවන් හඳුනාගෙන තිබේද;

(iii) ශිෂ්‍යභටයන් පුහුණු කිරීම සඳහා අවශ්‍ය පුහුණුව ගුරුවරුන්ට ලබා දී පාසල් සිසුන්ට ශිෂ්‍යභට පුහුණුව ලබාදීමට අවශ්‍ය පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1179/2022

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාවේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපළ හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියා සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියා වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1193/2022

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම සිමෙන්ති කම්හල සතු මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් අතරින් විවිධ පුද්ගලයන් හා ආයතන විසින් මේ වනවිට අනවසරයෙන් අත්පත් කර ගෙන ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම ඉඩම් නිරවුල් කර ගැනීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1312/2022

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018.03.05 දින මහනුවර, දිගන ප්‍රදේශයේදී ඇති වූ නොසන්සුන්කාරී තත්ත්වය පිළිබඳව දන්නේද;

(ii) ඒ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා තිබේද;

(iii) එසේ නම්, එවැනි සිද්ධීන් නැවත ඇති වීම වළක්වා ගැනීම සඳහා එම පරීක්ෂණයට අදාළ වාර්තාව මඟින් ලබා දී ඇති නිර්දේශ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් සිද්ධියට වගකිව යුතු පුද්ගලයන් හඳුනාගෙන තිබේද;

(ii) එසේ නම්, ඔවුන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(iii) එවැනි සිද්ධීන් නැවත ඇති වීම වළක්වා ගැනීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1470/2022

ගරු රෝහණ බංඩාර මහතා,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිරිසිදු පානීය ජලය නොමැති ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ග්‍රාම නිලධාරි වසමේ නම සහ පිරිසිදු පානීය ජලය නොමැති පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පානීය ජල ගැටලුව විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1730/2022

ගරු කිංස් නෙල්සන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඇති ගොවිජන සේවා කොට්ඨාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම කොට්ඨාසවල නම් කවරේද;

(iii) 2021 මහ කන්නය සඳහා පොහොර ඉල්ලුම් කරන ලද වී ගොවීන් සංඛ්‍යාව එම එක් එක් ගොවිජන සේවා කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඒ අතරින් මේ වනවිට පොහොර නිකුත් කර ඇති වී ගොවීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පොහොර ලබාදීම සම්බන්ධයෙන් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පවතින ගැටලු විසඳීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?